ජනතාවට සවන්දීමේ ප්‍රජා වැඩසටහන

# මත්ද්‍රව්‍ය නිවාරණය නීතියට හා පොලීසියට පමණක් කළ නොහැකියි

## කොළඹ නගර සභා විපක්ෂ නායක මිලින්ද මොරගොඩ




කොළඹ නගර සභාවේ විපක්ෂ නායක හා ජනාධිපති සම්බන්ධීකරණ හා ලේකම් මිලින්ද මොරගොඩ මහතා රැස්වීම අමතමින්

ආරියපාල-විදාගම

මත්ද්‍රව්‍ය නිවාරණය නීතියට සහ පොලීසියට පමණක් කළ නොහැක්කක් බැවින් එයට ගොදුරු වන්නන් වළක්වා ගැනීම සහ ගොදුරු වූවන් මානුෂික පුනරුත්ථාපනයට ලක්කිරීම ඉතා වැඩදායි බවත්, කොළඹ මහ නගර සභාවේ විපක්ෂ නායක හා ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිලින්ද මොරගොඩ මහතා පැවසීය.

ඔහු මේ බව පැවසුයේ කොළඹ කිරුළපන කිරුළ ව්‍යාපාරය විසින් එහි ප්‍රජාශාලාවේ පැවැති ප්‍රජා වැඩසටහනකදීය.

කොළඹ නගරයේ ජීවත් වන අඩු ආදායම්ලාභී නාගරික ජනතාවගේ සමාජීය හා පොදු ප්‍රශ්න පිළිබඳව සොයාබලා ඒවාට පිළියම් සැකසීම සඳහා දියත් කර ඇති ජනතාවට සවන් දීමේ ප්‍රජා වැඩ සටහන මෙසේ පසුගියදා ආරම්භවිය. මෙම වැඩ සටහනේ දී තව දුරටත් අදහස් පළ කළ මොරගොඩ මහතා .

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් ලේබල් අලවා සමාජයෙන් කොන්කිරීමෙන් ඔවුන් එයින් ගලවා ගත නොහැකියි. කිසියම් හේතුන් නිසා අද තරුණ තරුණියන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවෙනවා එසේ ඇබ්බැහි වූවන් සමාජගත කිරීමට වෛද්‍ය ප්‍රතිකාර සේවා ඔවුන්ට ආදරය අනුකම්පාව දැක්වීමත් ආගමික පරිසරයට හුරු කරවීමත්, ක්‍රීඩාව හා සෞන්දර්ය ක්‍රියාවලින්ට ඔවුන් යොමු කරවීමත් වැදගත්.

එසේ කරවීමෙන් ඔවුන් පුනරුත්ථාපනය කළ හැකියි.

මෙහිදී රැස්ව සිටි බහුතරයක් කාන්තාවන් ඉල්ලා සිටියේ මත්ද්‍රව්‍යවලට සීඝ්‍රයෙන් ඇබ්බැහි වන අපේ දරුවන් ආරක්ෂා කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් අවශ්‍ය බවයි.

මෙම අවස්ථාවට ජනාධිපති අධ්‍යක්ෂ හිටපු අමාත්‍ය ආර්.ඒ.ඩී සිරිසේන, කොළඹ නාගරික මන්ත්‍රී සුගත් කුමාර ආරියප්පෙරුම,හිටපු නාගරික මන්ත්‍රී සම්පත් රඹුක්කනගේ යන මහතුන්ද සහභාගීවී සිටියහ.